# සී/ස කෑගල්ල දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ

# තනතුරු පුරප්පාඩු

සී/ස කෑගල්ල දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ පහත පුරප්පාඩු වී ඇති තනතුර සඳහා සමිති අභ්‍යන්තරයෙන්, කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් වයස අවුරුදු 18 - 45 අතර (සමුපකාර සමිති සේවකයන්ට සහ සමිති අභ්‍යන්තර සේවකයන්ට වයස් සීමාව බලපානු නොලැබේ.) සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් 2021-12-24 දින සිට 2022-01-11 දක්වා මා විසින් කැඳවනු ලැබේ.

**තනතුර** : **ප්‍රධාන කළමනාකරු iii පංතිය (ප්‍රධාන විධායක ශ්‍රේණිය)**

පුරප්පාඩු සංඛ්‍යාව 01

**වැටුප් ක්‍රමය:** 34500.00 - 10X225 - 10X250 - 39250.00

**සුදුසුකම්** :

I. පිළිගත් විශ්වවිද්‍යාලයක වානිජ / ව්‍යාපාර පරිපාලන / ආර්ථික විද්‍යාව / විද්‍යාවේදී (ගණිතය / සංඛ්‍යානය) උපාධියක් ලබා තිබීම සහ පිළිගත් වානිජ / කාර්මික ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර 02 ක පළපුරුද්දක් තිබීම.

හෝ

II. පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව ලබා තිබීම හෝ පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ බැංකු කළමනාකරණ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම හෝ පිළිගත් වානිජ / කාර්මික ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර 03 ක පළපුරුද්දක් තිබීම.

හෝ

III. කාර්මික විද්‍යාලයේ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ පිළිගත් වානිජ / කාර්මික ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර 03 ක පළපුරුද්දක් තිබීම.

හෝ

IV. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ කළමනාකරණය පිළිබඳ ජාතික (උසස් පෙළ) සහතිකය ලබා තිබීම සහ පිළිගත් වානිජ / කාර්මික ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර 03 ක පළපුරුද්දක් තිබීම.

හෝ

V. සබරගමුව විශ්වවිද්‍යාලයේ සමුපකාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව ලබා තිබීම සහ පිළිගත් වානිජ / කාර්මික ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර 03 ක පළපුරුද්දක් තිබීම.

හෝ

VI. සමුපකාර ක්ෂේත්‍රයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී / නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) / ගණකාධිකාරී / මූල්‍ය කළමනාකරු තනතුරක වසර 05 ක හෝ සහකාර සාමාන්‍යාධිකාරී / බැංකු සේවා කළමනාකරු / කථිකාචාර්ය / මානව සම්පත් කළමනාකරු / පිරිස් කළමනාකරු / ලේකම් / සමුපකාර මණ්ඩල ලේකම් / වානිජ කළමනාකාර තනතුරක වසර 10 ක පළපුරුද්දක් තිබීම.

තමන් විසින් පිළියෙල කරන ලද අයදුම්පත, උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, ග්‍රාම සේවා සහතිකය, පළපුරුද්ද පිළිබඳ සහතික, හැඳුනුම්පත සහ වෙනත් සුදුසුකම් සහතිකවල ඡායා පිටපත් සමග පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**ගරු සභාපති, සී/ස කෑගල්ල දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය,**
**ලක්සල ගොඩනැගිල්ල, කෙලින් වීදිය,**
**කෑගල්ල.**
**ලිපි කවරයේ වම් පස උඩ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.**

**ගරු සභාපති,**
**සී/ස කෑගල්ල දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය.**